# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1834/42 – 2013 නොවැම්බර් 01 වැනි සිකුරාදා – 2013.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලැබූ ඉඩමේ පරවශතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශතාවේ විස්තරය.**– මාරස්සන ජල සම්පාදන ක්‍රමයේ, පොත්ගොඩ ජල ටැංකියේ ප්‍රවේශ මාර්ගය සහ ජල නළ එළීම සඳහා ඉඩම් කොටස්වල පරවශතාවය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, පොත්ගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/පීටීඑච්/2011/384පී හා 2012.06.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර්. 0.0054ක් පමණ වන ''ගලපිටහේන'' නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 01 – ගලපිටහේන – ප්‍රමාණය: හෙක්. 0054ක් පමණ**

උතුරට: සෝමා කුලසේකර හිමිකම් කියන ගලපිටහේන; නැගෙනහිරට: සෝමා කුලසේකර හිමිකම් කියන ගලපිටහේන සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ගලපිටහේන; දකුණට: ජේ. එස්. එම්. ලීලාවතී හිමිකම් කියන ගලපිටහේන; බටහිරට: ජ්. එස්. එම්. ලීලාවතී හිමිකම් කියන ගලපිටහේන සහ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/172.
2013 අගෝස්තු මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 622




*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්වල පරවශතාවය පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කොළඹ - හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ 172 වන කි.මී. පුළුල් කිරීමේ අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා ය.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩපත්තුව බටහිර සුළු කොට්ඨාසයේ, තලල්ල දකුණ ගමේ පිහිටි මාතර මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීවීඑන්/2012/667 හා 2013.04.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර ඒ සහ බී ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0427ක් පමණ වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර "ඒ" – මන්නහෙගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0087ක් පමණ**

උතුරට: කලපුව, මු.පි.මාර/2425හි කැබලි අංක 10 සහ 09; නැගෙනහිරට: මු.පි.මාර/2425හි කැබලි අංක 10 සහ 09; දකුණට: මු.පි.මාර/1829හි කැබලි අංක 20; බටහිරට: කලපුව.

02. **කැබලි අක්ෂර "බී" – මන්නහෙගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0340ක් පමණ**

උතුරට: මු.පි.මාර/1829හි කැබලි අංක 20; නැගෙනහිරට: මු.පි.මාර/1829හි කැබලි අංක 21, කලපුව සහ මු.පි.මාර/14286හි කැබලි අංක 01; දකුණට: මු.පි.මාර/14286හි කැබලි අංක 01; බටහිරට: මාර/14286හි කැබලි අංක 01 සහ මු.පි.මාර/1829හි කැබලි අංක 19.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/6//2012/එච්ඩබ්/329.
2013 ජූලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 623

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.